# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ඒකක පාදක ගාස්තු ක්‍රමයෙන් කාල පාදක ගාස්තු ක්‍රමයට පරිවර්තනය වීම සඳහා සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට දුන් නියෝගය

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතේ 12 වැනි වගන්තිය යටතේ පත්කළ විමර්ශන කමිටුව විසින් නිකුත් කළ 1999 මාර්තු 29 වැනි සඳුදා අංක 1073/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අන්තර්ගත නියෝග සම්බන්ධවයි. කොමිෂන් සභාව පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීමට අපේක්ෂා කරයි.

2.1 කාල පාදක ගාස්තු
2.2 කාල පාදක ගාස්තු පිළිබඳ නියෝගයට තුඩුදුන් හේතු

උක්ත නියෝගය මගින් කමිටුව සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට කාලපාදක අයකිරීම් ක්‍රමයක් ආරම්භ කිරීම සඳහා කාල සටහනක් නියම කර නොමැති නමුත් සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් මෙම නවීනතම ක්‍රමය තම පද්ධතියට හඳුන්වාදීම සඳහා කඩිනමින් ක්‍රියාකරනු ඇතැයි අපේක්ෂා කළේය.

එමෙන්ම කාල පාදක ගාස්තු ක්‍රමය අයිතමගත බිල්කරණය හඳුන්වාදීම සමග බැඳීපවතින්නක් බව එකී නියෝගයේ සඳහන් වේ. දැනට සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ සියලුම හුවමාරු මධ්‍යස්ථාන වලින් අයිතමගත බිල්පත් සපයනු ලබන බව දනිමු.

එමෙන්ම සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් නව බිල්කරණ ක්‍රමය හඳුන්වාදීමේදී මහජනතාව වෙත ලබාදුන් සහතිකය පිළිබඳව කොමිෂන් සභාව අවධානය යොමුකර ඇත. මහජනතාව වෙත සැලකළ එකී ප්‍රකාශන වලින්, නව බිල්කරණ ක්‍රමය යටතේ සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට කාලපාදක බිල්කරණ ක්‍රමයකට අවතීර්ණ විය හැකි බව මැනවින් පැහැදිලි වේ.

ඔබ දන්නා පරිදි කොමිෂන් සභාව විසින් සාක්ෂාත් කර ගත යුතු පොදු අරමුණක් වන්නේ අයකරනු ලබන ගාස්තු සහ සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සහ විදුලි සංදේශ උපකරණවල තත්ත්වය සහ විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ,ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පාවිච්චි කරන්නන්ගේ සම්බන්ධතාවන් හා පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීමයි. 4 (ඇ) වගන්තිය බලන්න.

එබැවින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ඔබට පහත දැක්වෙන කරුණු පිළිබඳව අවධානය යොමු කරන ලෙස මෙයින් නියෝග කරනු ලැබේ.

(අ) මෙම නියෝග නිකුත් කළ දින සිට මාසයක් ඇතුළත කාල පාදක (තත්පරයකට) බිල්කරණ ක්‍රමය සඳහා අයක්‍රම යෝජනාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.

(ආ) පනතේ 5 (ඔ) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව ගරු අමාත්‍යවරයාගේ එකගත්වයෙන් කොමිෂන් සභාව විසින් එකී අයක්‍රම නිශ්චය කිරීමෙන් පසුව, ඒ බව සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට දැනුම්දීම මත,එකී දැනුම්දීම මාසයක් ඇතුළත ක්‍රියාත්මක කිරීම.

කොමිෂන් සභාවේ අණපරිදි,


**අරුණ අමරසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08**
**දුරකථන - 2689354 ෆැක්ස් - 2689341 ඊමේල් - dgtsl@trc.gov.lk**


2005 සැප්තැම්බර් 22 වැනි දින.